දිවි අහිමි කරගැනීම් හෝ ඊට තැත් කිරීම් සම්බන්ධ සිදුවීම් වාර්තා කිරීමේදී, දිවි අහිමි කරගැනීමට උත්සාහ කළ ආකාරය සඳහන් කිරීම නොකළ යුතු වේ. මන්දයත්, අනුකාරක දිවි අහිමි කරගැනීම් සඳහා ඒ ඔස්සේ වක්‍රාකාරී දායකත්වයක් ලැබීමේ හැකියාවක් ඇති බැවිනි. එසේම දිවි අහිමි කරගැනීමට තැත් කිරීමට පදනම් වූ හේතුව සරලව දැක්වීම නොකළ යුත්තේ, දිවි අහිමි කරගැනීමේ සිතක් පැන නැගීමට සංකීර්ණ කරුණු ගණනාවක දායකත්වය ලැබිය හැකි බැවිනි. එසේම හදිසි උපකාරක අංක දිවි අහිමි කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවක් හා පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් අයෙකුගේ දිවි බේරා ගැනීමට ඉන් ඉඩක් ලැබෙනු ඇත.

අරුණ පුවත්පතේ පළවී තිබූ දිවි අහිමි කරගැනීමට උත්සාහ ගැනීමක් පිළිබඳ පුවත් වාර්තාව තුළ, ඉහත දැක්වූ දිවි අහිමි කරගැනීම් පිළිබඳ මාධ්‍ය ආචාර ධර්මයන්හි එන කරුණු තුනම උල්ලංඝනය වී තිබූ බව නිරීක්ෂණය කළ හැකි විණි.

එසේම එහි අදාළ පුද්ගලයාගේ දිවි ගලවාගත් දෙදෙනාගේ නම් සහ වාර්ගිකත්වයද සඳහන් වී තිබුණි. ඔවුන් සිදුකළ ක්‍රියාවේ ප්‍රශංසාව ලබාදීම සඳහා ඔවුන්ගේ නම් සඳහන් වී තිබුණද, ඊට අමතරව ඔවුන්ගේ වාර්ගිකත්වය සඳහන් කිරීම පුවතට අදාළ වන්නේ කෙසේද?

හදිසි උපකාරක අංක:

1333-CCCline
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #SinhalaPress #Aruna**
**See Less**